**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව දිනය - 2022.08.23 වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා
2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.මී.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10.එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11.ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.ටී.පී.ජී.කීර්තිසේන අල්විස් මැතිතුමා
20.එච්.ඒ.දිල්සාන් මධුෂිකා මැතිනිය
21.කේ.මධුෂිකා ප්‍රශාදිනි ජයසිංහ මැතිනිය
22.එම්.ඩී.ඥානවති මැතිනිය
23.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
24.බී.සීතා රංජනි මැතිනිය
25.ඒ.පී.ඩබ්ලිව්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය
26.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා
2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රීතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වී සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.රටේ පවතින තත්වයත් සමඟ සියළුම දෙනාට ආරාධනා කරනවා බල ප්‍රදේශයේ ජනතාවගේ ගැටළු අවශ්‍යතාවයන් පමණක් කථා කරලා ගැටළු විසදා ගැනීමට . සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.07.19 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරීම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරීම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.07.19 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.7.19 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන -**

***.** 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති බව ගරු මහ සභාවට නිවේදනය කරමි.

*.බහුත්වවාදය සහ ඇතුලත් කර ගැනීම පුහුණු වැඩ මුළුව 2022.08.25 වන දින වැන්දල රුවන්වැල්ල රාජගිරි හෝටලයේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.එම වැඩමුළුව සඳහා කාන්තා මන්ත්‍රීවරියන් සහභාගිවන ලෙස කාරුණිකව දන්වමි.

**(ඇ)ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 01. පහත නම් සඳහන් මහත්ම මහත්මීන් විසින් ආපදා ණය මුදලක් ඉල්ලීම් කර ඇත.එම මුදල් ගෙවීම් කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.
01.ඩී.ආර්.ආර්.ගුණසේකර මහතා - රු 250000.00
02.ජේ.ෂෙල්ටන් රත්නායක මහතා - රු.24975.00
03.ජේ.දිනේෂ් කුමාර් මයා - රු.24340.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 02. 1972.04.06 දින යොමු අංක 2/30/5/169 දරන පැවරුම් නියෝගයෙන් යටියන්තොට ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද බිම් ප්‍රමාණය රූඩ් 01 පර් 36.43 වන බලවත්තොට ඕවිටේ වත්ත නැමැති ඉඩම 2009.01.05 දිනැති පිඹුරු අංක 327 දරණ පිඹුරු පතට අනුව එම ඉඩමේ මායිම් නිරවුල් කර වැට සකස් කිරීමට මහජන නියෝජිතයන්ගෙන් යුතු කමිටුවක් පත් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, කමිටු සාමාජිකයින් ලෙස ගරු සභාපතිතුමා,ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා ,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය,සභාවේ ලේකම්,කාර්මික නිලධාරි සුදුසුයැයි මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, කමිටු සාමාජිකයින් පත් කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව කමිටු සාමාජිකයින් ලෙස ගරු සභාපතිතුමා,ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා ,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.පි.ඩබ්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය,සභාවේ ලේකම්,කාර්මික නිලධාරි පත් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ඉහත නම් කරන ලද කමිටු සාමාජිකයින් පත් කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 03.කිතුල්ගල මල්වත්ත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සිට වෛද්‍යවරුන් සහ ඖෂධ පහල ගරාගොඩ ප්‍රජා ශාලාවේ වෛද්‍ය සායනය වෙත රැගෙන ඒම වෙනුවෙන් SGYR 9710 දරන ත්‍රිරෝද රථ රියදුරුට මසකට රු.1500.00ක මුදලක් ගෙවනු ලබයි.වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් අමතර කොටස් හා සේවා මිල ඉහල යාම හේතුවෙන් එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් මාසික ගෙවීම් වටිනාකම මසකට රු.2000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇත.ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. පහත සඳහන් විස්තරවලට අදාල වරිපනම් ලේඛනයෙහි සඳහන් හිමිකරුගේ නම, ආයතනය වෙත ඉදිරිපත් වූ හිමිකම් සංශෝධන අයදුම්පත්‍රය හා ආදායම් පරීක්ෂක මහතාගේ වාර්තාවට අනුව වරිපනම් ලේඛනයේ තොරතුරු නව හිමිකරු නමින් සංශෝධනය සභාව විසින් කිරිම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | කො.අ | පාර | වරි.අං | ලේඛනගත හිමිකරු | වර්තමාන හිමිකරු |
|---|---|---|---|---|---|
| 1 | 2 | පරුස්සැල්ල පාර | 92 | ඩබ්.වෙන්ස් ස්ටාර් රෙක්ස් | බී.ටෙන්සන් ප්‍රනාන්දු |
| 2 | 1 | කරවනැල්ල පාර | 38 | කේ.වින්සන්ට් පෙරේරා | කේ.සුජිත් සංජය පෙරේරා |
| 3 | 5 | කරවනැල්ල පාර | 09 | යටියන්තොට ප්‍රාදේශීය | කේ.සුජිත් සංජය පෙරේරා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | 7 | පරස්සැල්ල පාර | 297 | සභාව(දෝෂයක් නිවරදි කිරීම)<br>කේ.ඩී.චමින්ද කුමාර හපු ආරච්චි | ඒ.ඒ.පොඩි මැණිකේ |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 05. ප්‍රධාන තක්සේරුකරුගේ අංක KE/RP/1699 හා 2022.06.20 දින ලිපිය මගින් දන්වා ඇති පරිදි 2022.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි යටියන්තොට පොදු වෙළඳපල සංකීර්ණයේ කඩ කාමර අංක 17,18,19 (මහජන බැංකුව) හි මාසික කඩ කුලී ගාස්තුව රු.120000.00 ක් දක්වා ප්‍රතිශෝධනය කර ඇත.ඒ අනුව තක්සේරු වටිනාකම ප්‍රතිශෝධනයෙන් පසු ගෙවිය යුතු හිඟ කුලී මුදල වන රු.80,000.00 ක මුදල හා නව තක්සේරුව අනුව ගිවිසුම අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ආරක්ෂිත තැන්පත් මුදල වන රු.120,000.00 ක මුදල අයකර ගිවිසුම්ගත වීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද පහත කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
01.මහවිල රසික මහතාගේ නිවස අසල සිට ෂර්ලි මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම - රු.300,000.00
02.මහවිල රසික මහතාගේ නිවස අසල සිට ෂර්ලි මහතාගේ නිවස දක්වා මාර්ගය 11 වන අදියර - රු.150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත සඳහන් ව්‍යාපෘතියට අදාල ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය මා යෝජනා කරනවා.
01. මහවිල වීරියගොල්ල මාර්ගය පස් කපා සකස් කිරීම - රු. 150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 08. 2022.07.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයේ භාවිතා කරන බ්‍රේලර් යන්ත්‍රය සඳහා අවශ්‍ය ගැල්වනයිස් බයින්ඩින් කම්බි ''**ෆෙන්ස් ටෙක් ට්‍රේඩින්** '' වෙතින් සපයා ගැනීමටත්, ඒ වෙනුවෙන් රු.95,000.00ක බිල්පත් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 09. කාර්යාලයෙහි සහ සෞඛ්‍ය අංශයේ කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය සීමාසහිත යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය වෙතින් සපයා ගැනීමටත්, ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | පෙන් ටෝච් බැටරි | 10 |
| 2 | කොහු කොසු | 20 |
| 3 | ඉදල් | 35 |
| 4 | විම් කැට | 10 |
| 5 | මොබ් | 10 |
| 6 | ක්ලෝරින් | 1kg |
| 7 | අත්මේස් (සාමාන්‍ය) | 100 |
| 8 | අත්මේස් (රබර් රෙදි මිශ්‍ර) | 300 |

| අනු අංකය | ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|---|
| 9 | අත්මේස් ( රබර් - දිග) | 200 |
| 10 | සබන් කැට (lifebuoy) | 200 |
| 11 | අත්සේදුම් දියර බෝතල් (500ml) | 20 |
| 12 | හාපික් බෝතල් (500ml) | 20 |
| 13 | ලයිසෝල් (500ml) | 30 |
| 14 | ප්ලාස්ටික් කොසු | 20 |
| 15 | වාහන සේදුම් දියර බෝතල් | 10 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 10.යටියන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් අප වෙත යොමු කරන ලද අංකYAT/LAN/PERMT/A2/17 දරන 2022.08.09 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි බී 183,කන්දේ කුඹුර,හක්බෙල්ලාවක ලිපිනයේ රජයේ ඉඩමක ජේ.ඒ.ශ්‍යාමා ලක්ෂාන් යන අය පදිංචිව ඇති බව දන්වා ඇත.ප්‍රාදේශීය සභා සීමාව තුළ නාගරික සංවර්ධන පනත ක්‍රියාත්මක ප්‍රදේශ වල අවම ඉඩම් බෙදුම් සීමාව පර්චස් 06 ක් බවත් දන්වා ඇත.නමුත් ශ්‍යාමා ලක්ෂාන් අයට ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0128 ක භූමි ප්‍රමාණයක් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බලපත්‍රයක් ලබා දීමට සභාවේ එකඟතාවය ලබා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,මෙම ඉඩමේ දැනට පදිංචිව සිටින බව දැන ගන්නට ලැබී තිබෙනවා.ප්‍රමාණය අඩු වුනාම ගොඩනැගිලි සැලසුම් අනුමැතිය ගැටළු සහගත විය හැකියි.ඉඩමේ පිහිටීම නොදැන විසඳුමක් ලබා දීම සුදුසු නෑ.ඒ නිසා ඉඩමේ පිඹුර අධ්‍යානය කරලා ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශවලට යටත්ව තීරණයක් ලබා ගැනිම ගරු සභාපතිතුමා විසින් සිදු කිරීම සුදුසුයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් පිඹුර අධ්‍යානය කර ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ වලට යටත්ව ගරු සභාපතිතුමා මගින් තීරණයක් ලබා දීම සඳහා සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් පිඹුර අධ්‍යානය කර ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ වලට යටත්ව ගරු සභාපතිතුමාට තීරණයක් ලබා දීම සඳහා ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.
**(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 11. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGGK 0627 දරන කැබ් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් දායක මෝටර්ස් ආයතනයට රු.57,530.00 ක බිල්පත් වටිනාකම සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12. 2022 අයවැයෙහි ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර ඇති මුදලින් පුනරාවර්තන වියදම් සඳහා වැය දැරීමට පහත පරිදි වැය ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කිරීමට ගරු මහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| වැය ශීර්ෂය | පිටු අංකය | අපේක්ෂිත ඉතිරිය පුනරාවර්ථන | ඉතිරිය | මාරු කරන ප්‍රමාණය | මාරු කරන වැය ශීර්ෂය | පිටු අංකය | අපේක්ෂිත වියදම පුනරාවර්ථන | මාරු කරන ප්‍රමාණය | නව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 109 (2) | 75 | ඉඩම් හා ගොඩනැගිලි | 1,000,000.00 | 500,000.00 | 104 (1) | 44 | වාහන යන්ත්‍ර සූත්‍ර අලු.නඩ | 250,000.00 | 305,315.00 |
| 609(2) | 239 | ඉඩම් හා ගොඩනැගිලි | 275,000.00 | 200,000.00 | 205(3)5 | 114 | LPG ගෑස් | 450,000.00 | 505,592.00 |
| | | | එකතුව | **700,000.00** | | | එකතුව | **700,000.00** | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 13. යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිරිකොහුතැන්න ග්‍රාම නිලධාරි වසමේ පදිංචිව සිටි කිරිහේන විදානලාගේ ශිලා පද්මිණි යන අය 2022.08.12 වන දින කොරෝනා ආසාදිතව මිය ගිය අතර ඇයට කිසිදු ඥාතියෙකු හෝ දරුවන් නොමැති අඩු ආදායම්ලාභියෙකු ලෙස සනාථ කර ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා දී ඇති ලිපිය අනුව සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මෘත ශරීරයක් යටියන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කර ඇත. එම ආදාහනය ගාස්තු රහිතව සිදු කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 14.2022 ජූලි මස ගෙවීම් වාර්තාව ( රු. 7,307,652.98 ) ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

## හදිසි යෝජනා

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) **16.** යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGPF 7470 දරන කැබ් රථය අලුත්වැඩියා කිරිම සඳහා අමතර කොටස් මිලදී ගැනීම හා බ්‍රේක් ඔයිල් ලබා ගැනිම වෙනුවෙන් වනුර හෝල්ඩින්ස් ආයතනයට රු.28,225.00 ක මුදලක් ගෙවීම් කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 17.** යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGPF 7470 දරන කැබ් රථය සේවා කිරිම වෙනුවෙන් සී.එන්.එස්.සර්විස් සෙන්ටර් ආයතනයට රු.48,110.00 ක මුදලක් ගෙවීම් කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 18.** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**01.** කරවනැල්ල බුදු මැදුර අසල මාර්ගය සංවර්ධනය කිරිම - 361,056.11

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 18)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා ඔබගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** (ඉ) 19.ගරාගොඩ පැරණි දුම්රිය මාර්ගයෙන් ප්‍රවිෂ්ය වන යකඩ පාලමේ දිරාපත් වී ඇති කුහරයක් මතු වි ඇත.ඊට කඩිනමින් විසඳුමක් ලබා දීමට අවශ්‍ය බලධාරින්ගේ අවධානය යොමු කරන මෙන් මා යෝජනා කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් කේ කේ සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. මේ පිළිබඳව හැකි ඉක්මනින් අදාල ආයතනය දැනුවත් කරන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 19)**

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01.2022 ජූනි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව

02. 2022 ජූනි මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව

03. 2022 ජූනි මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**

***. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී.ඥානවති මැතිනිය**

ගරු සභාපතිතුමනි, අමනාවල පුස්තකාලයේ ෆොටෝ කොපි මැෂිම අළුත්වැඩියා කටයුතු අවසන් කර ඉක්මනින් එම පහසුකම් ගම් වාසින්ට ලබා ගැනිමට එය යථා තත්වයට පත් කර ආපසු ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

***. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගල්පාත කොට්ඨාශය තුළ ඇති දැනට අක්‍රියව පවතින විථි පහන් අලුත්වැඩියා කර ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

. ගල්පාත ශ්‍රී සුමංගලාරාම විහාරස්ථානයේ ධර්මශාලාව ප්‍රදේශයේ ජනතාවගේ සියළුම පොදු කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයකි.ඒ ආසන්නයේම ඇති පෙර පාසල් ගොඩනැගිල්ල ද ජනතාවගේ පොදු අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයකි.පෙර පාසල් ගොඩනැගිල්ලේ ඇති අඩුපාඩු කීපයක් සංවර්ධනය කර ගැනීම සඳහා 2022 සභා අරමුදලින් රු.ලක්ෂයක් වෙන් කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

.  ගල්පාත වැකඩ රිටිගහඔය හරහා ඉදිකර ඇති 1989 වර්ෂයේ මහා ගංවතුරට කඩා වැටුණු කොන්ක්‍රීට් පාලමේ දැනට එම ස්ථානයේ රිටිගහ ඔය වැලි අතර සිරවී ඇති රේල් පීලි කීහිපය ගල්පාත එගොඩමුල්ල රිටිගහඔය නාන තොටුපළ මාර්ගයේ ඇති ඇළ මාර්ගයේ ඒ දඬු වශයෙන් යොදා ගැනීමට අවශ්‍ය නිසි අවසරය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ප්‍රදේශයේ ජනතාව ඉල්ලීම් කර ඇත.මේ කරුණු ගැන අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

***ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
පැලැල්ලේගම , හක්බෙල්ලාවක පදිංචි පී.ඩබ්.ජී.ආර් ලංකා ජයතිලක මිය විසින් මා වෙත එවා ඇති ලිපිය පහත පරිදි  වේ. මා විවාහක කාන්තාවක් වන අතර දරුවන් දෙදෙනෙකුගේ මවක් වෙමි.දැනට පවතින ආර්ථික අපහසුකම් මත  පවුලේ ජීවත් වීම මෙන්ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට මුදල් යෙදවීම මහත් දුෂ්කර වී ඇත.එබැවින් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර වින්සන්ට් පෙරේරා ක්‍රීඩාංගනයේ නෙත්මා ආයතනය ළග ඉදිකර ඇති දැනට වසා දමා ඇති බිල්ඩිම මා වෙත කුලී/බදු  ක්‍රමයක් යටතේ ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර  මං එහි කුඩා ව්‍යාපාරයක් කර (පොත් පත් අලෙවිකර) දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා මුදල් යෙදවීමට අදහස් කර ඇත.ඉදිරි කටයුතු සාර්ථකව කර ගැනිම සඳහා ඔබතුමාගේ කාරුණිකව මැදිහත් වීම අපේක්ෂා කරන බව එතුමිය විසින් දන්වා ඇත.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,ලංකා ජයතිලක මහත්මියට පුළුවන්නම් උදව්වක් කරන්න.කුලී පදනම මත හරි ලබා දෙන්න බලමු.

***ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ලංකා ජයතිලක මහත්මිය විසින් ඉල්ලා ඇති ස්ථානයේ සභාවේ උපකරණ තියෙනවා.අපේ මුරකරුවත් ඒකේ තමයි ඉන්නේ,

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි,නව සභා ගොඩනැගිල්ල විවෘත කර ඇති නිසා හැකි ඉක්මනින් සමරු ඵලකය හදමු .නව ගොඩනැගිල්ලේ පිරිතක් කියලා සාංඝික දානයක් දෙමු. අපේ අසනිප වී සිටින අල්විස් මැතිතුමාටත් සෙත් පතා ඒ වැඩ සටහන 2022.09.16 දින ගරු මන්ත්‍රීතුමන්ලාගෙත් කාර්යය මණ්ඩලයේත් සහයෝගයෙන් ඉටු කරමු.

***ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සංජීව මැතිතුමාගේ අදහස හොඳයි.අසනිප වී සිටින අල්විස් මැතිතුමාටත් සෙත් පතා පිරිත් දේශනාවක් සිදු කර පසුදා සාංඝික දානයක් දෙමු.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා**   ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා සහ එච්.පි.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**   ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල  මැතිතුමා සහ එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින්  අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**   යටියන්තොට කුලී රථ හිමිකරුවන්ගේ සමිතිය මගින් පරුස්සැල්ල කැළණි වැලි පොත් වෙළඳසැල අසල කුලී රථ වශයෙන් පවත්වාගෙන යන කුඩා ලොරි රථ සඳහා අවසර ලත් හිමියන් සඳහා වාහන පමණක් නතර කිරිම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඒ සඳහා අදාල දැන්වීම් පුවරු සකස් කර දෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ සංජීව අබේකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ව්‍යාපාරිකයන්ට ගැටළු නොවන විදිහට මාර්ග සංවර්ධන අධිකාරිය ,පොලිසිය සමඟ  සාකච්ඡා කරලා තීරණයක් ගන්න.

**ගරු උප සභාපති ඒ.වී. රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කරවනැල්ල සිට කිතුල්ගල දක්වා පරික්ෂා කර බලා අවධානම් සහිත ස්ථාන පිළිසකර කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සමහර මන්ත්‍රී තුමන්ලාගෙන් එක්සත් ජාතික පක්ෂයට විවිධ චෝදනා එල්ල වෙනවා.නමුත් 2020 සිට තනි මන්ත්‍රීවරයෙක් වශයෙන් එක්සත් ජාතික පක්ෂය රැක ගනිමින් මම ඉදිරියට යනවා.හැබැයි අනෙක් මන්ත්‍රීවරු 10 දෙනාම සමඟි බලවේගයට උදව් කරන බැවින් විනය පරීක්ෂණ පවා ඔවුන්ට තියෙනවා.ඒ කෙසේ වෙතත් 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ සිට ඔය සියව මන්ත්‍රීවරුන් නැති වුනත් මම පක්ෂය ආරක්ෂා කළා.ඔවුන් නොමැතිව යටියන්තොට ආසනය තුළ පක්ෂය ශක්තිමත් කළා. වෙනත් සංවිධානයන් හරහා මේ පක්ෂය යටියන්තොට ආසනයේ සංවිධානය කළා.මම දැන් කියන්නේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රතිපත්තිය පිළිගන්න බැරිනම් කකුල් දෙක දෙපැත්තේ නොසිට සමගිජන බලවේගයට ගොස් උදව් උපකාර කරන්න කියා මා ඉල්ලා සිටිනවා.මා හට පුළුවන් එක්සත් ජාතික පක්ෂය නඟා සිටුවන්න.දැනටමත් මා මේ ආසනයේ පාර්ලිමේන්තු මන්ත්‍රී දෙදෙනෙකු සමඟයි හැප්පි හැප්පි කටයුතු කරන්නේ,නමුත් පක්ෂයට අවශ්‍ය පිරිස සංවිධාන කටයුතු කරන්න ඕනෑම වෙලාවක පක්ෂය වෙනුවෙන් කැප කිරිමට

මා සූදානම් වෙලා ඉන්නේ,මා ඉදිරියේ දි ත් පක්ෂය වෙනුවෙන් සංවිධාන කටයුතු සිදු කරනවා.දැනටමත් මා හිතන ආකාරයට කෑගලු දිස්ත්‍රික්කයේ හොඳම ආසනය යටියන්තොට ආසනය බව ඕනෑම කෙනෙකුගෙන් අසා දැන ගන්න පුළුවන්.ඒ නිසා කරුණාකරලා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ පක්ෂය විවේචනය නොකරන ලෙස මා දන්වා සිටිනවා.

***ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සීතා රංජනි බුළුගොඩ මැතිනිය**

ගරු සභාපතිතකුමනි, ජංගම කුටි ටික ඉක්මනින් බෙදා දෙන්න පුළුවන්නම් හොඳයි.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

අද දින සභාවට පැමිණිලා සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් ,මාධ්‍ය ආවරණය සඳහා පැමිණි මාධ්‍යවේ දි මහත්වරුන්ටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් පෙ.ව 11.30 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.